# සජබ e කොළම.



(අශෝක ජයතුංග විසිනි)

😡 බ්‍රිතාන්‍ය නව ශ්‍රී ලංකා මහකොමසාරිස් වැඩ බාරගත් විගස වි: නායක සජිත් හමුවෙයි.

😡මන්ත්‍රී උද්දිකට වෙඩි තැබීම ගැන සජිත් හඬ නගයි. තුවක්කුකරුවන්ට රටේ පාලනය බාර නොදීම ආණ්ඩුවේ වගකීමයි - සජිත් කියයි.

😡 වි: නායක සජිත් මුල්
වරට වානිජ මණ්ඩල
ප්‍රධානීන් හමුවී රට ගොඩ
නගන අදහස් හා
යෝජනා ලබාගනී.

😡පාස්කු ප්‍රහාරයේ
මහමොළකරු
එළිනොකරනවා නම් එය
සොයා ගන්නට තරුණ
බලමුළු ගන්වනවා -
සජිත්.

😡පාර්ලිමේන්තුවේ
ප්‍රශ්න අහලා කාලය
කනවයි පොහොට්ටු
මන්ත්‍රීල ජනපතිට
පැමිණිලි කිරීමෙන්ම මම
හරි ප්‍රශ්න අහන බව
ඔප්පු වෙනවා - සජිත්.
😡මේ ආණ්ඩුවෙ
නායකයොත් ගෝටාගෙ
පාරේ ද යන්නේ. හැම
සත්‍යම යට ගැසීම හා

කල් දැමීමයි වෙන්නේ - මහලේකම් රංජිත්.

😡 වජිර කියන විදියට ජනපතිවරණයත් කල්ගිහින් රටේ නායකයා නීති විරෝධී වුණොත් IMF හා ලෝක ආධාරත් නවතීද - ගයන්ත අසයි.

😡 රටයි ලෝකයයි රවටන්න තවත් බොරු

කම්ටුවක් දාලා පාස්කු
විපත යට ගහන්න හදන
බවට කාදිනල්තුමාත්
චෝදනා කරනවා -
වෛද්‍ය රාජිත.

😡විශ්වාස හංග දිනුවම
සෞඛ්‍ය ප්‍රශ්න ඉබේ
විසදෙන බව ආණ්ඩුව
හිතනවද දන්නෙ නෑ -
රාජිත.

😡මත්පැන් සමාගම් 07 ක් බදුගෙවා නෑ. ඉන් 02 ක් කෝටි 150 ක් බදු පැහැර හැරලා. බෝතල් වල ව්‍යාජ ස්ටිකර් වලිනුත් රජයට කෝටි ගණන් පාඩුයි - පාඨලී.

😡වරාය නගරයේ නම මාරුකර මැදපෙරදිගදී ලෝක ප්‍රචාරයක් දෙන්න යනවා.ඒ ප්‍රචාරනයට

බ්‍රිතාන්‍ය හිටපු
අගමැතිලත් අරන්.
කබ්රාල් එදා ප්‍රචාරණයට
අරන් ෂො මිලි ගණන්
ගෙවපු කෙනා දැන් හිරේ
- ආචාර්ය හර්ෂ.

😡පාස්කු හා චැනල් 4
ගැන  ජනපති කමිටු
දාද්දි ආරක්ෂක
අමාත්‍යාංශය නිවේදන
දාලා සියල්ල ප්‍රතික්ෂේප

කිරීම හතරබීරි කතාවක් - මුජිබර්.

😡රට බංකොලොත්ලු. ඡන්ද තියන්න සල්ලිත් නැතිලු. ඒත් මන්ත්‍රීලගෙ පුච්චපු නිවාස වලට රු මිලි 1400 ක් ගෙවනවා. ඉන් 700 ක් දැනටත් ගෙවලා - හර්ෂන රාජකරුණා.

😡ඉන්දීය ඇමෙරිකා
ජපන් විරෝධතා මැද
චීන නැව් පෝළිමකට
ලංකාව ඉඩ දෙන්නේ
ඇයි දැයි ආණ්ඩුව
පැහැදිලි කල යුතුයි -
මරික්කාර්.

😡ආණ්ඩුව හරි පාරේ
නොයා කැලේ යනවිට
එය පෙන්වා දෙන අය
ත්‍රස්තයන් කර දඬුවම්

දෙන කැකිල්ලේ පනතක් සමාජ හා සෙසු මාධ්‍ය වලට එරෙහිව ගේන්න යනවා - නලින් බංඩාර.

😡ආණ්ඩුවේ ආරාධනා මත විදෙස් සංචාර නොයන්න සජබ තීන්දු කල නිසා මම නිව්යෝර්ක් සංචාරය ප්‍රතික්ෂේප කලා -

මොනරාගල දිස්: සජබ
මන්ත්‍රී එච්, එම්.
ධර්මසේන.

😡 රටේ ආරක්ෂාව
බින්දුවට දාලා පාතාලෙ
රජ කරනවා. ළදරුවන්
හා මිනිස්සුත් මරණවා.
ආරක්ෂක බලධාරීන්
නිදිද - අජිත් පී.

😡ක්‍රිකට් මැච් පැරදුනේ
පොහොට්ටු ඇඩ් එකේ

**මූසලකම නිසා කියන තරමට ඒ පක්ෂය අද ජනතාව අතර පිරිහිලා - අර්ල් ගුණසේකර.**